අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2006 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2006

ඉතිහාසය I කොටස
History Part I

## ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

### I කොටස

- අංක 1 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් **එකක් පමණක්** අනෙක් නම් සමඟ **නො ගැළපේ**. එම **නො ගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

01. (1) සහස්සතිත්ථ (2) මහාතිත්ථ (3) සූකරතිත්ථ (4) ජම්බුකෝළ පට්ටන (5) ගෝකණ්ණ (..............)

02. (1) රාජරට්ඨ (2) මහාගාම (3) මායාරට්ඨ (4) රෝහණ දේශ (5) දක්ඛිණ දේශ (..............)

03. (1) තප්රොබේන් (2) පලෙසිමුණ්ඩු (3) සෙරන්ඩිබ් (4) රාමගෝණ (5) පාරසමුද්‍ර (..............)

04. (1) ඝෝතුරූපාකාර (2) බුබ්බුලාකාර (3) ඝණ්ටාකාර (4) පද්මාකාර (5) ධාන්‍යාකාර (..............)

05. (1) ලංකාපුර දේව (2) ලංකාපුර කිත්ති (3) ලංකාපුර මඤ්ජු (4) ලංකාගිරි සෝර (5) ලංකාධිකාර බූදල්නා (..............)

06. (1) සේනා සම්මත වික්‍රමබාහු (2) ජයවීර බණ්ඩාර (3) කරල්ලියැද්දේ බණ්ඩාර (4) රයිගම් බණ්ඩාර (5) කොනප්පු බණ්ඩාර (..............)

07. (1) කොලින් කැම්ප්බල් (2) වොරිංටන් සාමි (3) එමර්සන් ටෙනන්ට් (4) චාර්ලිස් මැකාර්ති (5) ජේම්ස් ලොංඩන් (..............)

08. (1) පූවිරාජ පණ්ඩාරම් (2) පෙරිය පිල්ලෙ (3) එදිරිමාන සිංකම් (4) දෙවන සංකිලි (5) ආර්ය චක්‍රවර්ති (..............)

09. (1) ලංකා ලෝකය (2) ඥානාර්ථ ප්‍රදීපය (3) ගම්පෙරළිය (4) හින්දු ඕගන් (The Hindu Organ) (5) ලක්රිවි කිරණ (..............)

10. (1) ආනන්ද විද්‍යාලය (2) රාජකීය විද්‍යාලය (3) හින්දු විද්‍යාලය (4) සහිරා විද්‍යාලය (5) ධර්මරාජ විද්‍යාලය (..............)

- අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්න සඳහා **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

11. (1) වංසත්ථප්පකාසිනී - මහාවංශයට ලියන ලද අටුවාවකි.
(2) සරජෝතිමාලෙ - ජ්‍යොතිශ්ශාස්ත්‍රීය දෙමළ භාෂාවෙන් රචිත ග්‍රන්ථයකි.
(3) කඳවුරු සිරිත - දඹදෙණි යුගයේ රජවරුන්ගේ එදිනෙදා ජීවිතය ගැන විස්තරයකි.
(4) වීර සෝලියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි.
(5) පූජාවලිය - ශ්‍රී මහා බෝධිය ගැන ලියැවුණු වංස කථාවකි. (..............)

12. (1) බුද්ද පාරින්ද රජු - මපුරුම බුදදස ළපරිදෙව
(2) මහාසේන රජු - මින්නේරි දෙවියෝ
(3) නිශ්ශංකමල්ල - කාලිංග චක්‍රවර්ති
(4) දෙවන පරාක්‍රමබාහු රජු - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත
(5) හයවන පරාක්‍රමබාහු රජු - ෂඩ්භාෂා පරමේශ්වර (..............)

Past Papers Wiki

13. (1) ද කුටෝ - ලන්දේසි ආණ්ඩුකාරවරයෙකි.
(2) පිලිප්පුස් බැල්දියස් - ලන්දේසි පූජකවරයෙකි.
(3) ගොන්සාල්වේස් - කතෝලික පූජකවරයෙකි.
(4) ජෝන් පයිබස් - බ්‍රිතාන්‍ය පාතික දූතයෙකි.
(5) පෙද්රෝ ලෝපේස් ද සෞසා - පෘතුගීසි ආණ්ඩුකාරවරයෙකි. (..............)

14. (1) බඩහැල් බද්ද - කුඹල් ශිල්පීන්ගේ දෙපාර්තමේන්තුව
(2) කුරුවෙ බද්ද - අලි ඇතුන් ඇල්ලීම භාර දෙපාර්තමේන්තුව
(3) කොට්ටල් බද්ද - මුතු කිමිදීමේ දෙපාර්තමේන්තුව
(4) මඩිගෙ බද්ද - ප්‍රවාහන සේවා දෙපාර්තමේන්තුව
(5) මහ බද්ද - කුරුඳු දෙපාර්තමේන්තුව (..............)

15. (1) ලංකා ජාතික සංගමය - පොන්නම්බලම් අරුනාචලම්
(2) මහාබෝධි සමාගම - අනගාරික ධර්මපාල
(3) ලංකා කම්කරු සංගමය - ඒ. ඊ. ගුණසිංහ
(4) හලාවත සංගමය - ඩී. බී. ජයතිලක
(5) ද්‍රවිඩ සංගමය - ජී. ජී. පොන්නම්බලම් (..............)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන් එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වැන්කැටි අමුණ | A | දැදුරු ඔය |
| (ii) | හත්තොට අමුණ | B | වලවේ ගඟ |
| (iii) | ඇළහැර අමුණ | C | මහවැලි ගඟ |
| (iv) | මිණිපේ අමුණ | D | කළු ගඟ |
| (v) | කොට්ටබද්ද අමුණ | E | අඹන් ගඟ |

(1) **BDECA** (2) **BEDCA** (3) **BADEC** (4) **BDCEA** (5) **BAEDC** (............)

17.

| | X | | Y |
|---|---|---|---|
| (i) | මහා විජයබාහු රජු | A | ලීලාවතී බිසව |
| (ii) | මහා පරාක්‍රමබාහු රජු | B | තිලෝකසුන්දරී බිසව |
| (iii) | නිශ්ශංකමල්ල රජු | C | ශ්‍රී රංගම්මා බිසව |
| (iv) | පළමුවන විමලධර්මසූරිය රජු | D | කුසුමාසන දේවිය |
| (v) | ශ්‍රී වික්‍රම රාජසිංහ රජු | E | කල්‍යාණවතී බිසව |

(1) **BDECA** (2) **BEDCA** (3) **BADEC** (4) **BDCEA** (5) **BAEDC** (..............)

18.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වසභ රජු | A | මෞර්ය පෙළපත |
| (ii) | ධාතුසේන රජු | B | ලම්බකර්ණ පෙළපත |
| (iii) | පස්වන සේන රජු | C | නායක්කාර් පෙළපත |
| (iv) | දෙවන පරාක්‍රමබාහු රජු | D | මානවම්ම පෙළපත |
| (v) | කීර්ති ශ්‍රී රාජසිංහ රජු | E | දඹදෙණි පෙළපත |

(1) **BDECA** (2) **BEDCA** (3) **BADEC** (4) **BDCEA** (5) **BAEDC** (..............)

19

| | X | | Y |
|---|---|---|---|
| (i) | පැළැඳ සටන | A | මාතර දිස්ත්‍රික්කය |
| (ii) | දන්තුරේ සටන | B | කළුතර දිස්ත්‍රික්කය |
| (iii) | මුල්ලේරියාව සටන | C | බදුල්ල දිස්ත්‍රික්කය |
| (iv) | රන්දෙනිගල සටන | D | කොළඹ දිස්ත්‍රික්කය |
| (v) | කටුවන සටන | E | මහනුවර දිස්ත්‍රික්කය |

(1) **BDECA** (2) **BEDCA** (3) **BADEC** (4) **BDCEA** (5) **BAEDC** (..............)

| | X | | Y |
|---|---|---|---|
| 20. (i) | භික්ෂු අධ්‍යාපනය | A | සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර |
| (ii) | ගිහි බෞද්ධ අධ්‍යාපනය | B | වැලිවිට සරණංකර හිමි |
| (iii) | හින්දු අධ්‍යාපනය | C | ආරුමුග නාවලර්තුමා |
| (iv) | ඉංග්‍රීසි අධ්‍යාපනය | D | එච්. එස්. ඕල්කට්තුමා |
| (v) | නිදහස් අධ්‍යාපනය | E | කෝල්බෲක් කොමිසම |

(1) **BDECA** (2) **BEDCA** (3) **BADEC** (4) **BDCEA** (5) **BAEDC** (............)

- අංක 21 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා
(A) සහ (B) පමණක් නිවැරදි **නම්** ........................................ 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි **නම්** ........................................ 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි **නම්** ........................................ 3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි **නම්** ........................................ 4 ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි **නම්** ....... 5 ද, **තිත් ඉර මත ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. |

21. ලක්දිව බුදු දහම ස්ථාපනය කිරීම හා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවැරදි ද?
(A) මිහිඳු මහ තෙරුන් සහ දේවානම්පිය තිස්ස රජු අතර ප්‍රථම හමුවීම සිදුවූයේ පොසොන් මස පුර පසළොස්වක පොහෝ දින මිහින්තලාවේ දී ය.
(B) මිහිඳු මහ තෙරුන් විසින් භික්ෂු ශාසනය ලක්දිව පිහිටුවන ලදී.
(C) දේවානම්පිය තිස්ස රජු විසින් මහමෙවුනා උයන මහාසඞ්ඝයාට පූජා කරන ලදී.
(D) උඳුවප් මස පුර පසළොස්වක පොහොය දිනයේ දී සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ලක්දිවට ගෙන එන ලදී. (............)

22. කාවන්තිස්ස රජු විසින් රෝහණ රාජ්‍යය එක්සත් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග හා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර සාධකය / සාධක නිවැරදි ද?
(A) විවාහ සම්බන්ධතා (B) ආගමික කටයුතු
(C) යුද්ධ ක්‍රියාමාර්ග (D) වරප්‍රසාද සේවය (............)

23. උඩරට රාජධානියේ පාලන ක්‍රමය හා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර කරුණ / කරුණු නිවැරදි වේ ද?
(A) රාජ සභාවේ ප්‍රධාන උපදේශකයා පුරෝහිත විය.
(B) දිසාවනියේ ප්‍රධානියා තෝරාගනු ලැබුවේ ජනතාව විසිනි.
(C) රාජ සභාවේ ප්‍රධාන නිලධාරියා මහා අදිකාරම් විය.
(D) පළාත් පාලන ඒකක හඳුන්වන ලද්දේ දිසාවනි හෙවත් රට නමිනි. (............)

24. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය හා සම්බන්ධයෙන් පහත සඳහන් කවර නිලතලය / නිලතල නිවැරදි වේ ද?
(A) විදෝර් ද ෆසෙන්දා (B) රෙසිඩන්ට්
(C) කලෙක්ටර් (D) ඔපර් කූප්මන් (............)

25. දහනවවැනි සියවසේ හින්දු පුනරුදයෙහි ලා ආරුමුග නාවලර්තුමා ගේ නායකත්වය හා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ඔහු ශ්‍රී ලංකාවේ ස්වදේශීය දෙමළ ජාතින්ගේ හින්දු ආගම පිළිබඳ ව නොමැකෙන සලකුණක් තැබී ය.
(B) ඔහු මහා බෝධි සමාගම සමඟ සමීප සම්බන්ධතා පැවැත්වී ය.
(C) වන්නාර් පොන්නයි ශෛව ප්‍රගාස විද්‍යාලය පිහිටුවන ලද්දේ ඔහු විසිනි.
(D) මුස්ලිම් නෙයිසාන් නමැති ප්‍රවෘත්ති පත්‍රය ආරම්භ කරන ලද්දේ ඔහු විසිනි. (............)

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

26. සද්ධාතිස්ස රජුගේ පුතුන් හතරදෙනාගේ නම් දක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේ ද?
(1) ථූලත්ථන, පුලහත්ථ, ලඤ්ජතිස්ස, වට්ටගාමණී (2) ථූලත්ථන, ලඤ්ජතිස්ස, බල්ලාටනාග, පුලහත්ථ
(3) ථූලත්ථන, ලඤ්ජතිස්ස, බල්ලාටනාග, වට්ටගාමණී (4) ථූලත්ථන, බල්ලාටනාග, පුලහත්ථ, වට්ටගාමණී
(5) ලඤ්ජතිස්ස, වට්ටගාමණී, පුලහත්ථ, බල්ලාටනාග

Past Papers Wiki

27. ශ්‍රී ලංකාවේ රජකම පිළිබඳ අරගලයක දී එක් පක්ෂයක උදව් පිණිස පිටරට සෙබළුන් ගෙන්වා ගත් පළමු වන සිංහල රජු කවරෙක් ද?
   (1) ඉළනාග  (2) සිරිනාග  (3) අභයනාග
   (4) කුඤ්චනාග  (5) බුජ්ජනාග  (............)

28. පළමුවන පරාක්‍රමබාහු රජු සහ දෙවන ගජබාහු රජු අතර පැවති ආරවුල සමථයකට පත් කිරීම පිළිබඳ ඇති කර ගන්නා ලද ගිවිසුමක වාර්තාව සඳහන් වන්නේ පහත දැක්වෙන කවර අභිලේඛනයෙහි ද?
   (1) දෙවනගල පර්වත ලිපිය  (2) ගල්විහාර ලිපිය  (3) අඹගමු සෙල්ලිපිය
   (4) සංගමු විහාර සෙල්ලිපිය  (5) මිණිපේ සෙල්ලිපිය  (............)

29. පෘතුගීසීන්ගේ ආගමික කටයුතු හා සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය නිවැරදි වේ ද?
   (1) අන්‍ය ආගම් ඉවසීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.  (2) ආගමික ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
   (3) රෙපරමාදු ආගම ප්‍රචාරය කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.  (4) රෝමානු කතෝලික ආගමේ ව්‍යාප්තියට අනුබල දීම.
   (5) ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම පූජක තුමා ක්වේරෝස් වීම.  (............)

30. බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී වාරිමාර්ග සංවර්ධනය සඳහා කටයුතු කළ ආණ්ඩුකාරවරුන් හතර දෙනකුගේ නම් පිළිවෙළින් සඳහන් වන්නේ පහත දැක්වෙන කවර ලැයිස්තුවේ ද?
   (1) ෆ්‍රෙඩ්රික් නෝර්ත්, තෝමස් මේට්ලන්ඩ්, රොබර්ට් බ්‍රවුන්රිග්, හෙන්රි වෝර්ඩ්
   (2) ෆ්‍රෙඩ්රික් නෝර්ත්, එඩ්වඩ් බාර්න්ස්, හෙන්රි වෝර්ඩ්, ටොරිංටන් සාමි
   (3) හෙන්රි වෝර්ඩ් , ටොරිංටන් සාමි, හර්කියුලස් රොබින්සන්, ජේම්ස් ලොංඩන්
   (4) හෙන්රි වෝර්ඩ්, විලියම් ග්‍රෙගරි, ආතර් හැව්ලොක්, ආතර් ගෝර්ඩන්
   (5) හෙන්රි වෝර්ඩ්, හර්කියුලස් රොබින්සන්, විලියම් ග්‍රෙගරි, ආතර් ගෝර්ඩන්  (............)

- අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට **නො ගැළපේ. එම නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය තිත් ඉර මත ලියන්න.**

31. **පැරණි ලක්දිව වාරිමාර්ග පද්ධතිය**
   (1) කුඩා ගම් වැව් කෘෂිකාර්මික සමාජයකට අත්තිවාරම දැමී ය.
   (2) විශාල වාරිමාර්ග ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රථම පියවර ගත්තේ වසභ රජු ය.
   (3) මහාසේන රජුගේ පාලන සමයේ දී රජයේ මැදිහත් වීමෙන් වාරිමාර්ග ඉදිකිරීමේ වැදගත් පියවරක් ඇතිවිය.
   (4) කලාවැවේ සිට අනුරාධපුරයේ තිසාවැවට ජලය සැපයූ ජයගඟ කරවන ලද්දේ ධාතුසේන රජු විසිනි.
   (5) වාරිමාර්ග පිළිබඳ අයිතිය තිබුණේ රජුට පමණි.  (............)

32. **දඹදෙණි රාජවංශය**
   (1) තුන්වන විජයබාහු රජු දඹදෙණිය රාජවංශයේ ආරම්භකයා විය.
   (2) ඊට පෙර සිටි රජුන් සමඟ ඔහුට ඥාති සම්බන්ධතා නොතිබිණි.
   (3) තුන්වන විජයබාහු රජුට පසු ව රාජ්‍යය හිමි වූයේ දෙවන පරාක්‍රමබාහු රජුට ය.
   (4) චීන සෙන්පති චෙංහෝ විසින් මෙම පෙළපතේ අවසාන රජු චීනයට අල්ලාගෙන යන ලදී.
   (5) හතරවන පරාක්‍රමබාහු රජුගේ අභාවයත් සමඟ ම දඹදෙණිය පෙළපත අවසන් විය.  (............)

33. **විජයබා කොල්ලය**
   (1) විජයබා කොල්ලය සිදුවූයේ 1521 දී ය.
   (2) හයවන විජයබාහු රජු ඔහුගේ පුතුන් තිදෙනා විසින් ඝාතනය කරන ලදී.
   (3) රජු ඝාතනය කිරීමේ කුමන්ත්‍රණය මෙහෙයවන ලද්දේ අල්බගේරියා විසිනි.
   (4) විජයබා කොල්ලයේ දී උඩරට පාලක ජයවීර බණ්ඩාරගේ සහාය වැදගත් විය.
   (5) පියා ඝාතනය කිරීමෙන් පසු ව කුමාරවරුන් තිදෙනා අතර රාජධානිය බෙදාගන්නා ලදී.  (............)

34. **ලන්දේසි පාලනයේ බලපෑම්**
   (1) ලන්දේසීන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබුණු වැදගත්ම කල්පවතින දායාදය වූයේ රෝම-ලන්දේසි නීතියයි.
   (2) ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල පාලනය කරන සමයේ දී ඔවුහු මාතර දක්වා දකුණු දිග දුම්රිය මාර්ග ඉදි කළහ.
   (3) මාතර තාරකා කොටුව ඉදිකරන ලද්දේ ලන්දේසීන් විසිනි.
   (4) ලන්දේසීහු කුරුඳු, කෝපි, උක්, කපු වැනි බෝග හඳුන්වා දුන්හ.
   (5) ලන්දේසීහු 1737 දී මුද්‍රණ යන්ත්‍රයක් පිහිටවූහ.  (............)

35. **ශ්‍රී ලංකාවේ නියෝජන ක්‍රමයේ වර්ධනය**

(1) කෝල්බෲක් - මැකලම් ප්‍රතිසංස්කරණය යටතේ ඡන්ද බලය හඳුන්වා දීම.
(2) කොල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ ජාති මූල නියෝජනය
(3) මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ යටතේ ඡන්ද කොට්ඨාශ නියෝජන ක්‍රම ය
(4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ සර්වජන ඡන්ද බලය
(5) සෝල්බරි ප්‍රතිසංස්කරණ යටතේ කැබිනට් ක්‍රමය (................)

- පහත දැක්වෙන අංක **36** සිට **40** තෙක් වූ ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. **එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන්** දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත ලියන්න.**

**වගුව**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2. | නිවැරදි ය. | වැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදා දෙයි. |

| | | | |
|---|---|---|---|
| 36. | රටේ භූමිය රජතුමාට අයිතිය යනු පිළිගත් සම්මතය විය. | ශ්‍රී ලංකාව අභිභවනය කිරීමට චෝළයින් සැබවින්ම ආරම්භ කරන ලද්දේ පළමුවන රාජරාජ රජුගේ කාලයේ දී ය. | (.........) |
| 37. | පොළොන්නරුව සිත්කළු විශ්වරූපී නගරයක් බවට වෙනස් කිරීම සිදු කරන ලද්දේ හයවන පරාක්‍රමබාහු රජු විසිනි. | ගල් විහාර ප්‍රතිමා නිර්මාණය පොළොන්නරු රාජධානියේ කීර්තිය විදහා පායි. | (.........) |
| 38. | මහනුවර පැරණි ම දේවාලය වූයේ නරේන්ද්‍රසිංහ රජු විසින් ඉදිකරන ලද නාථ දේවාලයයි. | කොනප්පු බණ්ඩාර දෙවන රාජසිංහ නමින් උඩරට රාජ්‍යය ඉසිලීය. | (.........) |
| 39. | ශ්‍රී ලංකාවේ පොල් වගාව සම්බන්ධ ප්‍රමුඛත්වය දරන ලද්දේ දේශීය ව්‍යවසායකයින් විසිනි. | කෝපි සහ තේවලට වඩා අඩු ප්‍රාග්ධන ආයෝජනයකින් පොල් වගා කළ හැකි නිසාත් පොල්වතු නඩත්තු කිරීම ඉතා පහසු හා ලාභදායක වීම නිසාත් පොල් කර්මාන්තය සඳහා දේශීය ව්‍යවසායකයෝ මූලිකව ක්‍රියා කළහ. | (.........) |
| 40. | හෙන්රි බ්ලේක් ශ්‍රී ලංකාවේ අවසාන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා විය. | 1948 දී ශ්‍රී ලංකාව නිදහස් ජනරජයක් බවට පත් විය. | (.........) |

PAST PAPERS WIKI
PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2006 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2006

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න
ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් සපයා ඇත

## II කොටස

01. මහසෙන් රජුගේ පාලන සමය අවසානය දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමේ ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් මහාවංසය වැදගත් වන ආකාරය පහත දක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
    (i) මහාවංසයේ කර්තෘත්වය හා එය රචිත වකවානුව
    (ii) මහාවංසයේ දක්වෙන සිද්ධීන් අභිලේඛනමය මූලාශ්‍ර මඟින් සනාථ වීම.
    (iii) මූලාශ්‍රයක් වශයෙන් මහාවංසයේ දුර්වලතා (ලකුණු 14 යි)

02. වට්ටගාමණී අභය රජුගේ දේශපාලන සහ ආගමික කාර්ය සංසිද්ධීන් පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

03. අනුරාධපුර රාජධානියේ පිරිහීමට හා එහි බිඳවැටීමට තුඩුදුන් හේතු විග්‍රහ කරන්න. (ලකුණු 14 යි)

04. පහත දක්වෙන මාතෘකා ආශ්‍රයෙන් මහා පරාක්‍රමබාහු රජුගේ පාලන සමයේ වැදගත්කම සාකච්ඡා කරන්න.
    (i) මධ්‍යගත පරිපාලන ක්‍රමය
    (ii) වාරිමාර්ග ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු (ලකුණු 14 යි)

05. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳ පමණක් ඓතිහාසික සටහන් ලියන්න.
    (i) පණ්ඩුකාභය වෘත්තාන්තය
    (ii) පස්වැනි සියවස අවසානය දක්වා ශ්‍රී ලංකාවට ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණ
    (iii) ගම්පොළ යුගයේ ගෘහනිර්මාණ ශිල්පය
    (iv) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය (එක් කොටසකට ලකුණු 07 බැගිනි)

06. දෙවන රාජසිංහ රජුගේ කාර්‍ය සංසිද්ධීන් පහත දක්වෙන ශීර්ෂ යටතේ ප්‍රමාණ කරන්න.
    (i) රාජ්‍යත්වයට පත්වීම.
    (ii) මුහුණ දුන් අභියෝග හා ඒවා ජයගත් අන්දම
    (iii) ඔහුගේ ක්‍රියාකලාපයෙහි වූ දුර්වලතා (ලකුණු 14 යි)

07. ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පෘතුගීසීන් සහ ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිවල සමාන අසමානතා සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

08. "කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි."
    (i) කෝල්බෲක් කොමිසම පත්කිරීමට තුඩු දුන් සාධක මොනවා ද? (ලකුණු 02 යි)
    (ii) ආණ්ඩුක්‍රම සහ ආර්ථික ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කෝල්බෲක් කොමිසමේ ප්‍රධාන නිර්දේශ **දෙකක්** බැගින් නම් කරන්න. (ලකුණු 02 යි)
    (iii) කෝල්බෲක් කොමිසමේ නිර්දේශ අනුව සිදු කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)
    (iv) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැක්කේ මන් ද? (ලකුණු 07 යි)

09. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
    (i) පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ
    (ii) 1815 උඩරට ගිවිසුම
    (iii) දහනවවන සියවසේ දෙවැනි භාගයේ ඇති වූ ආගමික පුනරුදය
    (iv) ලංකා ජාතික සංගමය (එක් කොටසකට ලකුණු 07 බැගිනි )

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම** ස්ථාන ලකුණු කර නම් කරන්න. ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | | |
|---|---|---|
| (1) කලා ඔය | (2) මහියංගනය | (3) නාච්චදූව වැව |
| (4) පස්යොදුන් රට | (5) සෙංකඩගල | (6) උතුරු පළාත |
| (7) ත්‍රිකුණාමලය වරාය | (8) මාතර | |


(නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි සටහනට ලකුණු 05 බැගිනි)

පැරණි ප්‍රශ්නපත්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය නොමිලේ බෙදාහැරීම පිණිස පමණි
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2006 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2006

ප්‍රශ්න අංකය 10

විභාග අංකය..........................................................




WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library